**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය - 2019**
**-----------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක්ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍යා ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහ අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අවම වශයෙන් සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාලෝචනය කළ යුතු වුවද, එවැනි සමාලෝචනයක් සිදුනොකිරීම හේතුවෙන් පිරිවැය රු.3,010,448 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපළ පිරියත සහ උපකරණ තවදුරටත් භාවිතා කරමින් පැවතුණි. එසේ වුවත්, ශ්‍රී.ලං.රා.අ. ගිණුම්කරණ ප්‍රමිති අංක 3 ප්‍රකාරව එකී ඇස්තමේන්තුගත දෝෂය නිවැරදිකර එම වත්කම්වල පැවරුණු අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතුකර නොතිබුණු අතර මේ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ද නොතිබුණි. | මණ්ඩලයේ සීමිත කාර්ය මණ්ඩලයක් සිටින බැවින් හා පසුගිය වසරේ අවසන් මාසයේ ගණකාධිවරයා රෝහල් ගත කර සිටි බැවින්මෙම කාර්ය කිරීමට නොහැකි වූ අතර ඉදිරි වර්ෂ වලදී එය සිදු කිරීමට නිලධාරීන්ට උපදෙස් දී ඇත. | වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාලෝචනය කළ යුතු ය. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09 හි 15 වගන්තිය ප්‍රකාරව තොග, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් වඩා අඩු අගය මත වාර්තා කළ යුතු වුවද ,පිරිවැය රු.639,061ක අලෙවිය සඳහා වූ පොත්වල ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමෙන් තොරව එහි පිරිවැයට අගයකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිලධාරීන් දැනුවත් කර ඉදිරියේදී මේ පිළිබඳව අවධානය හා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇත. | තොග, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් වඩා අඩු අගය මත වාර්තා කළ යුතු ය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නොමිලේ බෙදාහරින ලද පොත් 843 ක පිරිවැය වූ රු.333,107 ක් පරිත්‍යාග ලෙස ගිණුම්ගත කරනු වෙනුවට සන්නිවේදන වැඩමුළු වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිලධාරීන් දැනුවත් කර ඉදිරියේදී මේ පිළිබඳව අවධානය හා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇත. | නොමිලේ බෙදාහරින ලද බැවින් පරිත්‍යාග ලෙස ගිණුම්ගත කළ යුතු ය. |
| (ආ) දේපළ පිරියත සහ උපකරණ සඳහා වූ ක්ෂය රු.104,895 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | නිලධාරීන් දැනුවත් කර ඉදිරියේදී මේ පිළිබඳව අවධානය හා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇත. | කාලපරිච්ඡේදය සඳහා වූ ක්ෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතු ය. |
| (ඇ) හිඟ පුවත්පත් ලියාපදිංචි ගාස්තු වූ රු.105,000 ක් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි. | නිලධාරීන් දැනුවත් කර ඉදිරියේදී මේ පිළිබඳව අවධානය හා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇත. | හිඟ ආදායම් උපචිත පදනමින් ගිණුම්ගත කළයුතු ය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී12/දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය | විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් බැගින් වර්ෂයකට රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී කමිටු රැස්වීම් 02ක් පමණක් පවත්වා තිබුණි. | 2019 වසරේ ප්‍රථම හා තෙවන කාර්තුවේ මණ්ඩලයේ ගණකාධිකාරිවරයෙකු ස්ථිර ලෙස පත් නොකර සිටීම නිසා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට | අවම වශයෙන් කාර්තුවකට වරක් බැගින් වර්ෂයකට රැස්වීම් 04 ක් පැවැත්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | නොහැකි වුවද ඉන්පසු කාර්තු දෙක තුළ රැස්වීම් දෙකක් පවත්වා ඇත. | |
| (ආ) 2011 නොවැම්බර් 30 දිනැති අංක ඩීඑම්එස්/ඊ4/37/4/238/2 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා නිවාඩු දින සහ වැඩකරන දිනවල රාජකාරි වේලාවෙන් පසු කරනු ලබන රාජකාරි සඳහා ගත කරන එක් දිනක් වෙනුවෙන් ලබාගත හැකි දීමනා අනුමත කර තිබියදී එම දීමනාවට අමතරව වැඩසටහන් 5 කදී ආහාර සහ නවාතැන් සඳහා මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් තිදෙනෙකුට රු.77,927 ක් ගෙවා තිබුණි. | ඇතැම් අවස්ථාවල දුෂ්කර ප්‍රදේශ වලද මෙවැනි වැඩසටහන් සිදුකරන බැවින් නිලධාරීන් පත්වන ප්‍රයෝගික ගැටළු හමුවේ දිනකට අනුමත වී ඇති දීමනාව වර්තමානය වන විට ප්‍රමාණවත් නොවේ.එබැවින් මේ පිළිබඳව ඉල්ලීමක් මේ වනවිටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත . | පවත්නා විධිවිධාන වලට යටත්ව දීමනා ලබාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,487,617 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.740,009 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.747,608ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයෙන් ලද ප්‍රදාන රු.1,504,199 කින් වැඩි වීම සහ අනෙකුත් ආදායම් රු.879,708 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2015 වර්ෂයේදී මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබුණු අතර 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා එය අතිරික්තයක් වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් ගැලපීමෙන් පසු 2018 වර්ෂයේ දී රු.14,974,854 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේ දී රු.18,210,648 ක් දක්වා සියයට 22 කින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය හා පුවත්පත් පැමිණිලි කොමිසම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් සිදුකර පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා ගිවිසුමකට එළඹ ඒ වෙනුවෙන් රු.200,000ක අත්තිකාරම් මුදලක් කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අංශය වෙත 2015 නොවැම්බර් 24 දින ගෙවා තිබුණු අතර | මේ සම්බන්ධව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ද දීර්ඝ ලෙස සාකච්ජා කළ අතර ඉතා කඩිනමින් වාර්තාව ලබාදෙන ලෙස අවස්ථා ගණනාවක දී ලිඛිතව හා වාචිකව ඉල්ලීම්කර ඇත. | අදාල වාර්තාව ලබාගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| සමස්ත පර්යේෂණ වාර්තාව එම ගෙවීමෙන් මාසයක් ඇතුළත ඉදිරිපත් කළ යුතුව තිබුණ ද 2020 මැයි 30 දින වන විටත් එම වාර්තාව ඉදිරිපත්කර නොතිබුණි. | | |
| (ආ) ජනමාධ්‍ය විෂයය පිළිබඳව 2013 වර්ෂයට පෙර සහ සමාලෝචිත වර්ෂය තුළදී මුද්‍රණය කරන ලද පොත් තොගයකින් වර්ෂය අවසාන වන විටත් පිරිවැය රු.639,061 ක් වූ පොත් 2303 ක් ඉතිරිව තිබුණි. මෙම පොත් අලෙවි නොවීම හේතුවෙන් වැඩි ප්‍රමාණයක් නොමිලේ බෙදාහැරීම සඳහා වූ මණ්ඩලයේ තීරණය අනුව පොත් 843 ක් 2019 වර්ෂය තුළ නොමිලේ බෙදා හැර තිබුණි. | එම පොත් සංචිතයෙන් දැනට ඉතිරි වී ඇති වැඩි පොත් ප්‍රමාණය පැරණි ඒවා බැවින් අලෙවි කිරීම දුෂ්කර වී ඇත. අමාත්‍යාංශයේ උපදෙස් පරිදි වැඩමුළුවලදී නොමිලේ මෙම පොත් බෙදා දුන්නද වෙනත් ප්‍රතිපත්තිමය කරුණු මත එය ඉදිරියට පවත්වාගෙන යාමට නොහැකි විය. | පොත් මුද්‍රණය කිරීමේදී අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන මුද්‍රණ කටයුතු කළ යුතුය. |
| (ඇ) 2010 මැයි 14 දිනැති අංක සීජ්/1/17/1 දරන ජනාධිපති ලේකම් කාර්යාල ලිපියේ 1 ඡේදය සහ පොදු ව්‍යාපාර කාරක සභාවේ 2012 ජූලි 10 දිනැති අංක 7 නියෝගය අනුව පුවත්පත් මණ්ඩලය රජයේ ගොඩනැගිල්ලක පවත්වාගෙන යායුතු බව අවධාරණය කර තිබුණ ද මණ්ඩලය ආරම්භයේ සිට වසර 20 ක පමණ කාලයක් කුලියට ලබාගත් පෞද්ගලික ගොඩනැගිලි වල පවත්වාගෙන ගොස් තිබුණ අතර, ඒ වෙනුවෙන් 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පමණක් ගොඩනැගිලි කුලී වශයෙන් රු.22,448,800 ක් වැයකර තිබුණි. | මේ සම්බන්ධව අවස්ථා ගණනාවකදීම රේඛීය අමාත්‍යාංශය මගින් හා මණ්ඩලයේ ඍජු මැදිහත්වීම මත අවශ්‍ය කටයුතු සිදු කළද ඒ සඳහා ප්‍රතිචාර නොලැබුණි. ඒ අනුව රජයේ ගොඩනැගිල්ලක් තිබේද යන්න පිළිබඳව පරීක්ෂාකර බැලුවද ගොඩනැගිල්ලක් සොයා ගැනීම දුෂ්කරවී ඇත. | රජයේ ආයතන සමඟ තවදුරටත් සාකච්ඡා කර සුදුසු ගොඩනැගිලි පරිශ්‍රයක් තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 1981 ඔක්තෝබර් 14 දිනැති අංක 162/5 ඒ දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර තිබෙන පුවත්පත් කලාවේදීන් සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහයට අනුව දිනපතා පළවන පුවත්පත් විමර්ශනය කර බැලීම සඳහා ක්‍රමවේදයක් පැවතියද පළවන පුවත්පත් ප්‍රමාණය හා සසඳන කළ සීමිත විමර්ශන වාර්තා ප්‍රමාණයක් පමණක් ඉදිරිපත් කර තිබුණි. එකී විමර්ශන වාර්තා සම්බන්ධයෙන් ද ආචාරධර්ම පිළිපැදීම පිළිබඳව අවශ්‍ය ඇගයීම් සිදුකිරීම කෙරෙහි මණ්ඩලයේ ප්‍රමාණවත් අවධානය යොමුවී නොතිබුණි. | මේ වන විටත් අදාළ පුවත්පත් පිළිබඳව මාසික වාර්තාවන් ඉහළ පරිපාලනයට ඉදිරිපත් කරන ලෙසත් පුවත්පත් පනත උල්ලංඝණය කිරීම පිළිබඳව හා ආචාරධර්ම බිඳී යාම පිළිබඳව නිරීක්ෂණ පුවත්පත් කතුවරුන්ට දැන්වීමටත් කටයුතු කර ඇත. | විමර්ශණ වාර්තා සම්බන්ධව සහ ආචාරධර්ම පිළිපැදීම පිළිබඳව අවශ්‍ය ඇගයීම් සිදුකිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමාණවත් අවධානය යොමුවිය යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුවත්පත් මණ්ඩල පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව සෑම පුවත්පතක්ම මණ්ඩලයේ ලියාපදිංචි කළ යුතු අතර එලෙස ලියාපදිංචි නොකර වෙළඳපලට නිකුත් කරන පුවත්පත් සම්බන්ධව අවශ්‍ය රීති හා නියෝග සම්පාදනය කිරීමට පනතේ 30 වන වගන්තිය ප්‍රකාරව බලය තිබුණ ද, මණ්ඩලය විසින් ඒ සඳහා රීති පිළියෙල කර නොතිබුණි. ලියාපදිංචි කළ යුතු පුවත්පත් සංඛ්‍යාව ලෙස මණ්ඩලය තක්සේරු කළ සංඛ්‍යාව 250 ක් වුවද 2019 වර්ෂයේ ලියාපදිංචි කළ පුවත්පත් සංඛ්‍යාව 180 ක් විය. නමුත් වෙළඳපල තුළ ලියාපදිංචිකින් තොරව අලෙවිය සිදුකරන පුවත්පත් පිළිබඳව විමර්ෂණ කිරීමට මණ්ඩලය කටයුතුකර නොතිබුණි. | ඇස්තමේන්තු අගයට වඩා අඩු අගයක් ලියාපදිංචි කිරීම පිළිබඳව එකඟවනු ඇත. කෙසේවෙතත් ඉදිරියේදී පුවත්පත් අලෙවිසල් වෙත මණ්ඩලයේ විමර්ශන නිලධාරීන් යවා අවශ්‍ය ලියපදිංචි කිරීම්යාවත්කාලින කර ගැනීමට කටයුතු කරනු ඇත.එසේම පුවත්පත් මණ්ඩල නියෝග (සාමාන්‍ය) වල ලියාපදිංචි නොවුනහොත් ගත හැකි ක්‍රියාමාර්ග විස්තරාත්මකව සඳහන් කර නොමැති බැවින් ඊට අදාළ රීති සකස්කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | ලියාපදිංචියකින් තොරව අලෙවි කරන පුවත්පත් පිළිබඳව විමර්ශණය කිරීමට මණ්ඩලය කටයුතු කළ යුතු ය. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රවෘත්ති පත්‍ර වලට විරුද්ධව මහජනතාව සහ විවිධ ආයතනවලින් පැමිණිලි 79 ක් ලැබී තිබුණු අතර 2018 වර්ෂයේ නොවිසඳී තිබූ පැමිණිලි 38ක් ද සමඟ විසඳීමට තිබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 117 ක් විය. ඉන් පැමිණිලි 60 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට විසඳා නොතිබුණු අතර එම නොවිසඳූ පැමිණිලි 60න් 21 ක් වසර 01සිට වසර 06 ක් දක්වා විසඳීමට ප්‍රමාද වූ ඒවා විය. සමාලෝචිත වර්ෂය තුළදී පැමිණිලි 02 ක් සඳහා නියෝග ලබාදී තිබුණු අතර එකඟතාවයට පත්වූ පැමිණිලි 32ක් විය. | පැමිණිල්ලක් ලද විගස සතියක් ඇතුළත පරීක්ෂණ කැඳවනු ලැබේ.තවත් සති දෙකකින් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ ආරම්භ කරනු ඇත . | පුවත්පත් පැමිණිලි සඳහා විසඳුම් ලබාදීමේ කටයුතු කඩිනම් කළයුතු ය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස්දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලය විසින් පිළිවෙලින් 1993 නොවැම්බර් 05 සහ 2009 සැප්තැම්බර් 07 දිනයන්හි ආරම්භ කරන ලද පර්යේෂණ අරමුදල සහ ණය අරමුදල සඳහා බැංකු ගිණුම් දෙකක් පවත්වාගෙන යන අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුම්වල ශේෂය පිළිවෙලින් රු.3,696,320 ක් සහ රු .1,974,390 ක් විය. අංක එෆ්අයිඑන්168 /පීර්එන්/ සහ 2017දෙසැම්බර් 19 දිනැති මණ්ඩලයේ සභාපතිගේ ලිපිය මගින් මෙම අරමුදල් ගිණුම් පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ඉල්ලා තිබුණ ද 2020 ජුනි 09 දින වන විටත් එම අනුමැතිය ලැබී නොතිබුණි. | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යංශ ලේකම්තුමා සමග සාකච්ජා වාර කිහිපයක් පැවැත් වූ අතර එහිදි ලේකම්තුමා දන්වා සිටියේ පර්යේෂණ අරමුදල හා ණය අරමුදල යන ගිණුම් දෙක සඳහා අනුමැතියක් ලබාදීමේ හැකියාවක් ඇති බවය. | අරමුදල් ගිණුම් පවත්වාගෙන යාම සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2013 වර්ෂයේ සිට අනුමත වී තිබුණු සහකාර පුවත්පත් කොමසාරිස් තනතුර 2019 දෙසැම්බර් 31 දින වන විට ද පුරප්පාඩුව පැවතුණි. | කඩිනමින් නව නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කරනු ඇත. | නව නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කළ යුතු ය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් වූ වැඩ සටහන් 04 ක් ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණු අතර සන්නිවේදන සාකච්ඡා 50 ක් පැවැත්වීමට සැලසුම්කර ඒ සඳහා රු.200,000 ක් වෙන්කර තිබුණ ද සාකච්ඡා 20 ක් පමණක් පවත්වා ඒ වෙනුවෙන් රු.20,000 ක් වැයකර තිබුණි. | පාස්කු ප්‍රහාරය සිදුවීමත් සමඟ අප්‍රේල්,මැයි සහ ජුනි මාස වලදී සැලසුම් කළ වැඩසටහන් කීපයක් රටේ පැවති ආරක්ෂක තත්ත්වය මත සිදුකිරීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 133 හා මුදල් රෙගුලාසි 134 ප්‍රකාරව මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක නොවන අතර මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයට අභ්‍යන්තර විගණන තනතුරක් ඇතුළත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන තනතුරක් අනුමත කරන ලෙස ඉල්ලීමක් රේඛිය අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

### 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැයගත හා තත්‍ය ආදායම් අතර සියයට 38 සිට සියයට 117 දක්වාත් අයවැයගත හා තත්‍ය වියදම් අතර සියයට 16 සිට සියයට 61 දක්වාත් විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි. | අයවැය ලේඛනයට අනුව බොහෝ දුරට කටයුතු කිරීමට උත්සාහ දරා ඇති අතර ඉදිරි වර්ෂවලදී මෙවැනි විචලනයන් අවම කර ගනිමින් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. | අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගැනීමට කටයුතු කළ යුතුය. |